දූෂණ සංජනන දර්ශකයේ ශ්‍රී ලංකාව 91 වෙනි ස්ථානයේ

වාර්ෂිකව නිකුත් කෙරෙන ලෝක දූෂණ සංජනන දර්ශකයේ [CPI Index] පසුගිය වසරට සාපේක්ෂව ප්‍රගතියක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාව මෙවර රටවල් 178 ක් අතරින් 91 වෙනි ස්ථානය හිමිකරගෙන තිබේ.

පසුගිය වසරේදී රටවල් 180 ක් අතරින් ශ්‍රී ලංකාවට හිමිව තිබුණේ එම දර්ශකයේ 97 වෙනි ස්ථානයයි.

2009 වර්ෂයේදී ශ්‍රී ලංකාවට හිමිවී තිබූ 3.1 වූ ප්‍රමාණය 0.1 ක මට්ටමකින් වර්ධනය කර ගනිමින් මෙවර 3.2 ක ලකුණු ප්‍රමාණයක් හිමිකර ගැනීමට ශ්‍රී ලංකාව සමත්ව ඇති අතර එම දර්ශකයේ ශ්‍රී ලංකාව හා සම තත්ත්වයට පත්වෙමින් (91 වෙනි ස්ථානය) බොස්නියා සහ හර්සෙගොවීනා, ගැම්බියා, ගෝතමාලා, කිරිබැටි සහ ස්වාසිලන්ඩ් යන රටවල්දු 3.2 ක ලකුණු ප්‍රමාණයක් බැගින් හිමිකරගෙන තිබේ. මෙම දර්ශකය අනුව ලෝකය පුරා පවත්නා දූෂණයේ ප්‍රමාණය සමීක්ෂණ කුම ආශ්‍රයෙන් අැගයීමට ලක්කෙරෙන අතර ඒ අනුව රටක් අන්න දුෂිත නම් ලකුණු '0' ක්ද සම්පූර්ණයෙන් දූෂණයෙන් තොර නම් ලකුණු '10' ක්ද වශයෙන් බිංදුවේ සිට 10 දක්වා වන පරාසයක් තුළ ලකුණු ලබාදීම සිදුකෙරේ.

මෙවර දූෂණ සංජනන දර්ශකයේ ප්‍රථම ස්ථානය හිමිකරගෙන ඇත්තේ ඩෙන්මාර්කය, නවසීලන්තය හා සිංගප්පූරුව යන රටවල් ත්‍රිත්වයයි. එම රටවල් වීසින් හිමිකරගෙන ඇති ලකුණු ප්‍රමාණය 9.3 කි. ලකුණු 9.2 ක ප්‍රමාණයක් ලබාගනිමින් ෆින්ලන්තය හා ස්වීඩනය එම දර්ශකයේ දෙවැනි ස්ථානයද 8.9 ක ලකුණු ප්‍රමාණයක් හිමිකරගනිමින් කැනඩාව තෙවැනි ස්ථානයද හිමිකරගෙන තිබේ.

පසුගිය වසරට සාපේක්ෂව යම් වර්ධනයක් පෙන්නුම් කිරීමට ශ්‍රී ලංකාව සමත්ව ඇතත් ශ්‍රී ලංකාව තවමත් පසුවන්නේ දූෂණ මට්ටම අතින් අගයපත් මට්ටමේ පවත්නා රටවල් අතරය.

මෙම ලකුණු ප්‍රමාණය අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයය තුළ තවමත් අනතුරුදායක මට්ටමකින් දූෂණය පවත්නා බව තහවුරු වේ.

දූෂණ සංජනන දර්ශකය ලෝකය පුරා ආයෝජකයන්, ආධාර දෙන කණ්ඩායම් හිරන්තරයෙන් පරිශීලනය කරන දර්ශකයක් වන අතර ලෝකයේ දූෂණ මට්ටම මැන බැලීම සඳහා යොදාගැනෙන එකම ජාත්‍යන්තර දර්ශකය වනුයේද මෙයයි.

ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙල දෙසැම්බර් 09 දා

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙල දෙසැම්බර් 09 ඉ සවස 4.00ට බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ මිහිලික මැදුරේදී පැවැත්වේ.

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී දිනය යෙදෙන එදින ප්‍රණාම උළෙල් ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගිවන්නේ මාධ්‍යවේදියෙකු, ගත් කතුවරයෙකු සහ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය පිළිබඳ ආසියාවේ පුබල ක්‍රියාකාරිකයෙකු වන කනක් මාලි ඩික්සිත් මහතාය.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙල මෙවර පවත්වනු ලබන්නේ 07 වෙනි වරටය.

වසර 2004 දී පළමු වරට සුපිළිපන් ප්‍රණාම උළෙල ආරම්භවූ අතර එතිදී ජ්‍යෙෂ්ඨ විශාරද අධිකාරී ලලිත් ඇඹන්වල සහ ගවේෂණාත්මක මාධ්‍යවේදී පෝද්දල ජයන්ත යන මහත්වරුන් සම්මානයට පාත්‍රවූහ.

මෙවර සුපිළිපන් සම්මාන සඳහා අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව ලැබුණු අයදුම්පත් අතුරින් සම්මානලාභීන් මේ වන විට තෝරාගනු ලැබ ඇත. එම විනිශ්චය මණ්ඩලයට විදුලි සංදේශ මධ්‍යමන හා තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණයකු වන ආචාර්ය රොහාන් සමරජීව, ගත්කතුවරයෙකු හා කාන්තා අධ්‍යාපන සහ විමර්ශන මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සෙලීචි තිරුවන්දුන් සහ විදෙශ ලේඛකයෙකු සහ ජනමාධ්‍යවේදියෙකු වන නාලක ගුණවර්ධන යන මහත්ම මහත්මීන් අයත් වූහ.

ඔවුන් විසින් තෝරාගනු ලැබූ සම්මානලාභීන් කවුරුන්දැයි ප්‍රණාම උළෙලේදී ප්‍රකාශයට පත්කෙරෙනු ඇත.

මෙතෙක් පැවති ප්‍රණාම උළෙලවලදී උපනන්දු සේනාරත්න මහතා (2005), එස්.බී. මායාදුන්නේ මහතා හා බී.ඒ.ඩබ්. අබේවර්ධන මහතා (2006), එස්.කේ. ලියනගේ මහතා (2007), තුෂිත පිටිසල මහතා සහ ප්‍රියන්ත ප්‍රසාන්දු මහතා (2008), චන්දන ජයතිස්ස මහතා (2009) සුපිළිපන් සම්මාන දිනාගැනීමට සමත්වූහ.
මෙයට අමතරව මොහොන් දමිසන්ති සිල්වා මහත්මිය (2006), ශෂාමලා ප්‍රසාන්දු මහත්මිය (2007), දේශබන්ධු සේනාරත්න මහතා (2008), සහ අයිරාංගනී ද සිල්වා මහත්මිය (2009) විනිසුරු මඩුල්ලේ විශේෂ සඳහන් කිරීමට ලක්විය.

අපේ ප්‍රධාන අමුත්තා

මෙවර ජාතික සුපිළිපන්ස ප්‍රණාම උළෙලේ ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගී වන්නේ ප්‍රසිද්ධ ලේඛකයකු හා සංස්කෘතිකවරයෙකු වන නේනාලු ජාතික කතෘත් මාලි ඩික්සිත් මහතාය. ඔහු ප්‍රධාන පෙළේ සමාජ ක්‍රියාකාරයෙකු ද වෙයි.

දකුණු ආසියානු කලාපයෙන් ඔබ්බට සංස්කෘතික වර්ධනය පිළිබඳ උනන්දුවක් දැක්වමින් ඔහු 1987 දී 'මිහාල් සඳුන්මිසියන්' සහ 'මිහාල් තබළසත්‍රියා' යන මාතෘක ප්‍රකාශන ආරම්භ කළ අතර අද දක්වාම එම ප්‍රකාශනවල සංස්කාරකවරයා ලෙසින් කටයුතු කරයි.

මෙම ප්‍රකාශන මගින් දකුණු ආසියාවේ සමාජයීය සහ සංස්කෘතික විෂයයන් පිළිබඳව ඔහු සෙරෙන විලාස පාරයකින් සහ විචාරයකින්යුතව දැඩි ප්‍රකාශයට තේතු වී තිබේ.

ඔහු තේතාලයේ රජ පෙළපත වෙනුවට ප්‍රජාතාන්ත්‍රික වෘත්තවාදකුගේ පාලනයක් ඇතිකිරීම සඳහා පෙළඹෙසුණු 'ජන ආන්දෝලන' තමයි ජනතා ව්‍යාපාරයේ පුරෝගාමීකයකු ලෙසද කටයුතු කෙළේය.

වසර 2005 න් පසු පිම්ටොගනු ලැබූ සිව්වැ සමාජ වේදිකාවේ ආරම්භකයකුදු කෙනෙම් දකුණු ආසියාවේ ප්‍රජාතන්ත්‍රවාදය, බහුත්වවාදය සහ මාධ්‍ය නිදහස ප්‍රචලිත කිරීම සඳහා දැඩි පරිශ්‍රමයක යෙදී සිටී.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයක් උදෙසා

සුපිළිපන්
නොවැම්බර් 2010

දූෂණයේ ප්‍රතිවිපාක

දූෂණය විසින් රටක ප්‍රජාතන්ත්‍රවාදය මෙන්ම නීතියේ ක්‍රියාත්මකවීමයද අඩපන කරනු ලබයි. එමගින් මානව හිමිකම් කඩකරනු ලබන අතරම රජයක් පිළිබඳ මහජන විශ්වාසයද පළුදු කරනු ලබයි. පොදු සේවාවන් සැපයීමට රජයකට ඇති හැකියාවද එමගින් අවිනිශ්චිත තත්ත්වයකට පත් කෙරේ.

විවිධ ආධාර දෙන සංවිධාන, ජාත්‍යන්තර මූල්‍ය ආයතන මෙන්ම සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ලබාදෙන ආධාර මුදල් අතරින් ඇමරිකානු ඩොලර් බිලියන 1000 ක පමණ මුදලක් පැහැරගැනීමට හා දූෂණයට ලක්වන බව අණාවරණය වී තිබේ.

ලෝක බැංකුව විසින් සිදුකළ සමීක්ෂණයකදී හෙළිදරව් වී ඇති ආකාරයට දූෂණය මැඩලීමත් නීතිය ක්‍රියාත්මකවීම ශක්තිමත් කිරීමත් හරහා රටක වර්ධන වේගය සෑම වසරකදීම සියයට 400 කින් වැඩි කරලීමට හැකියාව ලැබේ.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයක් උදෙසා

සුපිළිපන් දේශයක් උදෙසා
දූෂණය මැඩලීමට පෙළගැසෙමු

චීන්න අප හා එක්වන්න

28/1, බුලර්ස් පටුමග, කොළඹ 07
Tel: 0112501474 Fax: 0112592287
tisl@tirilanka.org www.tirilanka.org
facebook.com/tirilanka twitter.com/tirilanka

පොල්පිතිගම ග්‍රාම නිලධාරිවරුන්ට යහපාලනය ගැන පුහුණුවක්

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරිවරු 69 දෙනෙකු සඳහා ග්‍රාම නිලධාරි රාජකාරි කටයුතු හා යහපාලනය පිළිබඳ පුහුණු වැඩමුළු දෙකක් ඔක්තෝබර් 27 - 30 දිනවල පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පවත්වන්නේ.

වඩාත් හොඳ මිහජන සේවාවක් සඳහා ග්‍රාම නිලධාරිවරුන්ගේ ශක්‍යතා වර්ධනය අරමුණු කරගනිමින් පැවැත්වූ මෙම වැඩමුළුවේ සම්පත්දායකයන් වශයෙන් අධිතීරිඳු අබේරත්න, හිටපු නියෝජ්‍ය විගණකාධිපති විජේපාල වාසල, කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් ලේකම් එච් එම් පී හිටිසේකර, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් ආර්.එම්.ආර්. රත්නායක හා පොල්පිතිගම සහකාර ප්‍රාදේශීය ලේකම් ආර්.පී.පී. පොඩිබෙරිස් යන මහත්වරු සහභාගී වූහ.

විශ්ව විද්‍යාල ආචාර්යවරු සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය

තොරතුරු දැනගැනීමේ අයිතිය ගැන මහජනතාව දැනුම්වත් කිරීමේ TISL වැඩසටහන් මාලාව යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ආධුනික කථිකාචාර්යවරු සඳහා පුහුණු වැඩමුළුවක් සැප්තැම්බර් 14 දින එම විශ්ව විද්‍යාලයේදී පැවැත්විණ.

හිටෝජ්‍ය විධායක අධ්‍යක්ෂ රුක්ෂණ නානායක්කාර හා අවබෝධාත්මක පෙළඹවීමේ අංශයේ අධ්‍යක්ෂිකා දිල්රංජනී හඳුන්නෙත්ති මෙම වැඩමුළුවේ සම්පත් දායකයන් වශයෙන් සහභාගී වූහ.

ග්‍රාම නිලධාරිවරුන් සඳහා පුහුණු වැඩමුළුවක්

ප්‍රාදේශීය පරිපාලන ආයතනවල වගවීම ඉහල නැංවීමේ වැඩසටහන යටතේ නැගෙනහිර නුවරඑළිය දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුග්‍රහවත් සේවය කරන ග්‍රාම නිලධාරිවරුන් සඳහා වන කාර්යාභිවර්ධන පුහුණු වැඩමුළුවක් සැප්තැම්බර් 16 දින අනුරාධපුර සී.ටී.සී. උත්සව ශාලාවේදී පැවැත්විණ.

ග්‍රාම නිලධාරිවරුන් වශයෙන් රාජකාරි කටයුතු ඉටු කිරීමේදී මුහුණ දීමට සිදුවන ගැටළු හා ඒවාට විසඳුම් සොයාගැනීම ආකාරය, සුපිළිපන් දේශයක් නිර්මාණය කරගැනීම සඳහා රාජ්‍ය නිලධාරියකු වශයෙන් ග්‍රාම නිලධාරිවරයෙකුට ලබාදිය හැකි සුදුසුකම් දායකත්වය යන කරුණු පිළිබඳ මෙහිදී සාකච්ඡා කෙරිණි. මෙම පුහුණු වැඩමුළුවේ සම්පත්දායකයන් වශයෙන් උතුරු මැද ප්‍රළාත් ආණ්ඩුකාර ලේකම් එම්. එස්. බී. රත්නායක, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් පී.එල්. මදනායක, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ශක්‍යතා ප්‍රවර්ධන අංශයේ හිතිඳු සදුන් ගුණවර්ධන යන මහත්වරු සහභාගී වූහ.

ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන්

TISL සංවිධානය කරන ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් මාලාව යටතේ ප්‍රධාන මාධ්‍ය ආයතනවල විද්‍යුත් මාධ්‍යවේදීන් වෙනුවෙන් සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් පසුගිය ඔක්තෝබර් මාසයේදී පැවැත්විණ.

TISL හා SAFMA ආයතන ඒකාබද්ධව සංවිධානය කළ විද්‍යුත් මාධ්‍යවේදීන්ගේ පුහුණු වැඩමුළුව සඳහා ප්‍රධාන විද්‍යුත් මාධ්‍ය ආයතන හියෝජනය කරන මාධ්‍යවේදීන් 22 දෙනෙකුද, ත්‍රිකුණාමලයේ පැවති ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්ගේ වැඩමුළුව සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය හියෝජනය කරන මාධ්‍යවේදීන් 18 දෙනෙකුද සහභාගී වූහ.

සී. දොඩාවත්ත, ශාන් වීජේතුංග, දිල්රංජනී හඳුන්නෙත්ති හා ආනන්ද දයසේකර යන මාධ්‍ය පුහුණුකරුවන් සමඟ TISL විධායක අධ්‍යක්ෂ ජේ.සී. වැලිඅමුණ, යංග් වීෂියා ටෙලිවිෂන් ආයතනයේ ප්‍රධාන කර්තෘ ශාමිණී බොයිල්, TISL හියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ රුක්ෂණ නානායක්කාර මෙම වැඩසටහන්වල සම්පත්දායකයන් වශයෙන් සහභාගී වූහ.

ගෙඩිරිත් රිඛෝ පදනමේ මූලික ද්‍රව්‍ය සටහන් ස්වයංක්‍රීය යුතු යැයිද වාර්තාවෙන් වැඩිදුරටත් හිරිඳේශ කර තිබේ.

සුපිළිපන්
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා - පුවත් හසුන නොවැම්බර් 2010

ඇතුල් පිටු
2. 18 වෙනි ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථා සංශෝධනය
3. භාරකාර රජයක් යටතේ මැතිවරණ පවත්වන්නැයි යෝජනාවක්
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සේවා ගැන මහජන තෘප්තිමත්භාවය මැන බැලීම
5. අපගේ ක්‍රියාකාරකම්

මාධ්‍යවේදී පෝද්දල ජයන්ත

අන්තර්ජාතික සුපිළිපන් ප්‍රණාමයෙන් පිදුම් ලබයි

ශ්‍රී ලංකාව තුළ දූෂණය මැඩලීම වෙනුවෙන් ඉදිකළ ඒකීය මාධ්‍ය මෙහෙවර අගයමින් 2010 වසරේ ජාත්‍යන්තර සුපිළිපන් සම්මානය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය විසින් ගවේෂණාත්මක මාධ්‍යවේදී පෝද්දල ජයන්ත මහතා වෙත පිරිනමන ලදී.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය මෙම සම්මානය පිරිනමනු ලැබුවේ පසුගිය නොවැම්බර් 12 වනදා තායිලන්තයේ බැංකොක් නුවරදී පැවති අන්තර්ජාතික දූෂණ විරෝධී සමුළු සැසිවාරයේදීය.

ජීවිත තර්ජන පවා නොතකා දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වෙමින් ඔහු විසින් ඉදුකරන ලද මෙහෙවරත් ශ්‍රී ලංකාව තුළ නිදහස් මාධ්‍ය වාතාවරණයක් ගොඩනැගීමට අදාතිකද ධෛර්යයෙන් කටයුතු කිරීමත් මෙම සමුළුවේදී ඇගයීමට ලක්විය.

මෙම සම්මාන උළෙලට රටවල් 134 ක රාජ්‍ය නායකයින්, රාජ්‍ය නිලධාරීන් හා සිවිල් සංවිධාන නියෝජිතයින් 1200 කට වැඩි පිරිසක් සහභාගී වූ අතර රුසියානු හිතිඳු නැසීගිය මැග්නිත්ගේ සහ ප්‍රංශයේ ශ්‍රෙෂ්ඨ මීන්කාරා යන මහත්වරුද මෙහිදී සම්මානයට පාත්‍ර වීය.

අන්තර්ජාතික සුපිළිපන් ප්‍රණාමය ශ්‍රී ලංකාවට පිරිහෙමුණු දෙවෙනි අවස්ථාව මෙයයි. මීට පෙර එය වසර 2000 දී සන්ඩේ ලීඩර් පුවත්පතේ තර්තය ලෙසින් විතුතෑගය මහතා වෙත පිරිහෙමුණි.

පෝද්දල ජයන්ත මහතා ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තා වූ විශාලතම වංචාව ලෙස සැලකෙන රුපියල් මිලියන 357 වැඩි බදු වංචාව මුල්වරට හෙළිදරව්කළ ජනමාධ්‍යවේදියාය. 1989 වර්ෂයේදී සිංදහස් ලේඛකයෙකු ලෙස 'රාවය' පුවත්පතින් ජනමාධ්‍යකරණයට පිවිසි ඔහු 1994 දී ලේක්හවුස් ආයතනයේ 'සිළුමිණ' පුවත්පතට සම්බන්ධවී රාජ්‍ය මාධ්‍ය ආයතනයක් තුළ සේවයේ යෙදෙමින්ම මහා පරිමාණයේ වංචා-දූෂණ රැසක් ගවේෂණාත්මකව හෙළිදරව් කළේය.

පසුගිය වසරේ ඔහු පැහැරගෙන යමින් එල්ලකෙරුණු දරුණු වධ හිංසාවලින් පසු ආබාධිතයකුවූ පෝද්දල ජයන්ත මහතා ජීවිත ආරක්ෂාව පතා රටින් පිටව ගියේය. ඔහුට සම්මාන ප්‍රදානෝත්සවයටද සහභාගිවීමට නොහැකිවූ අතර ඔහු වෙනුවෙන් සම්මානය පිළිගනු ලැබුවේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ ජේ.සී. වැලිඅමුණ මහතා විසිනි.

> ''මෙය මගේ ජීවිතයේ අති විශේෂ අවස්ථාවක්. මෙවන් ගෞරවාන්විත සම්මානයක් පිරිනැමීම ගැන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයට මගේවෙනුවෙන් ස්තූතිවන්තවෙමි. මෙම සම්මානයෙන් මා වෙත පැවරෙන භාරදූර වගකීම අනාව මගේ ජීවිතයේ ඉදිරි කාලයේදී දූෂණයට එරෙහිව තවදුරටත් සටනකිරීමට ඇපකැපවෙන්නෙමි. ඒ මා දෙන පොරොන්දුවයි. කැරුණාකර මා මගේ දූෂණ විරෝධී පසුපල සම්බන්ධකර ගන්න''
>
> සම්මානලාභීන්ගේ පණිවුඩය ඉදිරිපත් කරමින් පෝද්දල ජයන්ත මහතා ප්‍රකාශ කළේය.

නීතිඥ වැලිඅමුණ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් අධ්‍යක්ෂ මණ්ඩලයට

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ ජේ.සී. වැලිඅමුණ මහතා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ජාත්‍යන්තරයේ අධ්‍යක්ෂ මණ්ඩලයට වැඩි ඡන්දයෙන් තේරී පත්වී ඇත.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ජාලය විසිදෙ ඇති රටවල් 100 කට අධික හියෝජනයන්ගේ සහභාගීත්වයෙන් පසුගිය නොවැම්බර් 09 වෙනිදා බැංකොක් නුවර පැවති එම සංවිධානයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී මෙම පත්වීම සිදුකරනු ලැබීය.

දූෂණ විරෝධී ක්‍රියාකාරකයකු හා මානව අයිතිවාසිකම් පිළිබඳ හිතිවේදියකු වන ජේ.සී. වැලිඅමුණ මහතා අධ්‍යක්ෂ මණ්ඩලයට තරග වදුළු සියළු අපේක්ෂකයන් අතුරින් වැඩිම ඡන්ද සංඛ්‍යාවක් හිමිකර ගැනීමට සමත් වීය. එම ආයතනයේ ප්‍රතිපත්තිමය තීන්දු ගන්නා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා මොහුය. වසර අටක කාලයක් තිස්සේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජය යන අංශවල සහයෝගය ලබාගනිමින් දූෂණ විරෝධී ක්‍රියා මාර්ගයන්ට ඔහු නායකත්වය සැපයීය.

කොළඹ විශ්ව විද්‍යාලයේ හිතිය පිළිබඳ පශ්චාත් උපාධිධරයකු වන වැලිඅමුණ මහතා, අමේරිකාවේ අයිසන්හවර් සහ ඉන්දියාවේ ජෙසෂ්ඨ අශෝක අධිශිෂ්‍යත්වලාභියකුදු වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 18 වෙනි සංශෝධනය

ජනාධිපති බලතල තවදුරටත් ශක්තිමත් කිරීමක්

හඳිසි පනතක් වශයෙන් ඉදිරිපත් කරනු ලැබූ 18 වෙනි ව්‍යවස්ථා සංශෝධන පනත 2010 සැප්තැම්බර් 08 වනදා පාර්ලිමේන්තුවේදී විවාදයට ගන්නා විට ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු පවා විසි අන්තර්වගනය නොදැන සිටි බව වාර්තාවන බව එම සංශෝධනය පිළිබඳවදා තත්ත්වය වාර්තාවක් නිකුත් කරමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය සඳහන් කර සිටී.

මෙම පනත රවේ යහපත සඳහා වන හඳිසි පනතක් ලෙස කැබිනට් මණ්ඩලය විසින් සහතික කරනු ලැබුවේද වචනයි සහතික කිරීමකට දායකවීම සඳහා එහි විධිවිධාන පරිකෂා කර බලනු ජණිස ප්‍රමාණවත් කාලයක් කැබිනට් මණ්ඩලයට පවා ලැබී නොතිබූ බවද එම තත්ත්ව වාර්තාවේ සඳහන් වේ.

පනත ඉදිරිපත් කිරීමේදී නියමිත ක්‍රියාවලියට සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට එකඟතාවය නොදැක්වීම පිළිබඳ ගැටළුව පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහතා විසින් මතුකරනු ලැබූ බව එහි සඳහන්වී ඇත.

පළාත් සභාවලට හා බලය විමධ්‍යගත කිරීමට බලපෑමේ ඇති කරන, ව්‍යවස්ථාවට අයත් විධිවිධාන තිබිපයක් 18 වෙනි සංශෝධනය මගින් අවලංගු කර ඇත. පළාත් සභා ලැයිස්තුවේ අඩංගු කරා කරුණක් සම්බන්ධයෙන් වුවද කිසිසේම පාලක පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන්නේ නම් එයට පෙර විශේෂ යෝජනා සම්මත කිරීමක් ඇතා 46 වී දරන ස්ථාවර නියෝගයක් අනුව අවශ්‍ය වෙයි. එමගින් මසක කාලයක් ඇතුළත තම අදහස් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නයි ඉල්ලුමින් අදාළ සංශෝධන පනතේ පිටපතක් එක් එක් පළාත් සභාව වෙත යැවීමට කථානායකයාට පියවර ගත යුතුය. එහෙත් මෙම සංශෝධනය සම්බන්ධව එම විධිවිධාන කිසිවක් අනුගමනය කර නැති බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පෙන්වා දෙයි.

මෙම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ අර්ථාන්විත සාකච්ඡාවක් උදෙසා එකදු කතුවැකියක් හෝ වෙන් නොකෙරුණ අතර මේ සම්බන්ධව විවාදයට ලබාදුන් කාලයද සීමිතය. මූලික වශයෙන් 18 වෙනි සංශෝධනය ඉදිරිපත් කරනු ලැබ තිබුනද ජනාධිපති ධුර කාලය දෙවතාවකට සීමා කිරීම ඉවත් කිරීම හා රාජ්‍ය සේවය හා පොලිසිය දේශපාලනීකරණය වීමෙන් වළකාලනු පිණිස පනවන ලද නීති රීති ඉවත් කිරීම යන අරමුණු මුදුන්පත් කරගනු පිණිසය.

17 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටත් පිහිටුවන ලද ව්‍යවස්ථාදායක සභාවට ස්වාධීන කොමිෂන් සභාවලට සාමාජිකයන් තෝරාගැනීමේ බලය මෙන්ම අගවිනිසුරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්, විගණකාධිපති, නීතිපති වැනි ප්‍රධාන තනතුරු සඳහා ජනපතිවරයා නම් කරනු ලබන පුද්ගලයන් අනුමත කිරීමේ බලය තිබිණි. රාජ්‍ය සේවයේ හා පොලිස් සේවයේ හිඳධාරීන්ට බීයෙන් තොරව රාජකාරි ඉටු කිරීමටද, නීතියේ පාලනය තහවුරු කිරීමට අරහස විශ්වාසය ලබාදීමටද සිදුවීය. නමුත් 18 වැනි සංශෝධනය යටතේ ප්‍රධාන තනතුරුවලට හිඳධාරීන් පත්කිරීමේ බලය සහමුලින්ම ජනපතිවරයා වෙත පැවරී-මෙන් පාර්ලිමේන්තු සභාවලට තුදු නරඹන්නෙකුගේ තත්ත්වයට පත් කර ඇත.

රාජ්‍ය සේවය හා පොලිස් සේවය දේශපාලන ඇඟිලි ගැසීම්වලින් ඈත් කරවීම සඳහා වූ වැදගත් ආරක්ෂක පියවර 18 වැනි සංශෝධනයෙන් ඉවත් කර ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මානව හිමිකම් කොමිෂන් සභාව හා අල්ලස් හා දූෂණ පිළිබඳ කොමිෂන් සභාව යන කොමිෂන් සභා ඇතැම්විට සියළු කොමිෂන් සභාවලට අදාළ සියළු සාමාජිකයින් නව සංශෝධනය යටතේ සෘජුවම ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබයි.

මේ අනුව 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දුන් ආකාරයෙහි විනිවිදභාවය පිළිබඳ කිසිදු ප්‍රතිපාදයක් නොමැති අතර සහභාගීත්වය ප්‍රජාතන්ත්‍රවාදයේ අපේක්ෂිත ප්‍රතිනිධිවල ප්‍රබල අඩුවක් එහි තවමත් තිබේ. එමෙන්ම එය ජාතික යහපත උදෙසා හඳිසි යැයි සහතික කිරීමෙහි කිසිදු තාර්කික පදනමක් හෝ යුක්ති සහගතභාවයක් නොමැතිබව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ නිගමනයයි.

එමෙමන් ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉහළ අධිකරණයක විනිශ්චයකට යටත්වීමක් හෝ ප්‍රබල ලෙස පාර්ලිමේන්තුවට වගවීමක් හෝ නොමැති ජනපතිවරයාගේ බලතල වඩාත් ශක්තිමත් කර ඇත.

භාරකාර රජයක් යටතේ මැතිවරණ පවත්වන්නැයි යෝජනාවක්

සෑම මැතිවරණයක්ම භාරකාර රජයක් යටතේ පැවැත්විය යුතු අතර සහ සිවිල් සමාජය විසින් පිළිගනු ලබන සහ ප්‍රජාතන්ත්‍රවාදීත් පූර්ණ පුදුගලයකුගේ නායකත්වයෙන් යුත් කොමිසමක් මැතිවරණ සමගේදී පොදු දේපළ අයථා පරිහරණය විමර්ශනය සඳහා පත් කළ යුතු යයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය යෝජනා කර සිටී.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වසර 2010 දී පැවති ජනාධිපතිවරණයේදී සහ පාර්ලිමේන්තු මැතිවරණයේදී පොදු දේපළ සුරැකීමේ වැඩසටහන හරහා මැතිවරණ හිරිකෑණ කරවුනු සිදුකිරීමෙන් පසු සිය අවසන් වාර්තාව හිතුත් කරමින් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත.

බරපතල මැතිවර